**2023 මැයි 28 වන දින පැවති මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් යෝජනා ස්ථිර කළ ව්‍යවස්ථා සංශෝධනයන්.**

1. **8.7.7 වගන්තිය සංශෝධන කිරීම**

**පවතින වගන්තිය**

කෘත්‍යාධිකාරී මණ්ඩලයට පත් වීමෙන් පසු රැස්වීම් වාර ගණනින් 50% කට අඩු රැස්වීම් වාර ගණනකට සහභාගී වී ඇති කෘත්‍යාධිකාරී මණ්ඩල සභිකයින් ඉදිරි වසරේ කෘත්‍යාධිකාරී මණ්ඩල සභික ධුරයට නුසුදුස්සෝ වෙති.

**එකතු කළ යුතු සංශෝධනය**

කෘත්‍යාධිකාරී මණ්ඩලයට පත් වීමෙන් පසු රැස්වීම් වාර ගණනින් 50% කට අඩු රැස්වීම් වාර ගණනකට සහභාගී වී ඇති කෘත්‍යාධිකාරී මණ්ඩල සභිකයින් ඉදිරි වසරේ කෘත්‍යාධිකාරී මණ්ඩල සභික ධුරයට නුසුදුස්සෝ වෙති. එහෙත් පහත සඳහන් කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයින් සඳහා එය බල නොපායි.

8.2 ගරු සභාපති - ගරු විදුහල්පති

8.5.2.ආසන්නතම පෙර සිටි ගරු ක්‍රියාකාරී සභාපතිතුමා

8.5.3.නියෝජ්‍ය විදුහල්පතිවරයෙක් ( නිළ බලයෙන්)

8.5.4.ක්‍රීඩා භාර්ය ආචාර්ය ( POG) ( නිල බලයෙන්)

8.5.9.ගරු ක්‍රියාකාරී සභාපති, ගරු සම ලේකම්වරු, ගරු භාණ්ඩාගාරික යන නිලධාරීන්ගේ අභිමතය පරිදි පත්කරන සම්පත් දායක පුද්ගලයින් දසදෙනා (10)

2. **සාමාජිකත්වය**

**පවතින වගන්තිය**

5.1.සියළුම සාමාජිකයින් යාවජීව විය යුතු වේ.

**එකතු කළ යුතු සංශෝධනය**

5.2. තාවකාලික සාමාජිකත්වය ලබා දීම.

උසස් පෙළ විභාගය අවසන් වූ දා සිට වයස අවුරුදු 25 දක්වා තාවකාලික සාමාජිකත්වය ලබා දීම.

තාවකාලික සාමාජිකත්වය පහත සඳහන් කොන්දේසි වලට යටත් වේ.

-සාමාජිකයාගේ විසිපස්වන (25) උපන් දිනයට පෙර යාවජීව සාමාජිකත්වය ලබා ගත යුතුය. නොඑසේ නම් ඔහුගේ සාමාජිකත්වය අවලංගු වේ. විසිපස් වන (25) උපන් දිනයට පෙර යාවජීව සාමාජිකත්වය ලබා ගතහොත්, සාමාජිකත්වය ලැබූ දිනය ලෙස තාවකාලික සාමාජිකත්වය ලැබූ දිනයම සලකනු ලැබේ. එසේ යාවජීව සාමාජිකත්වය ලබා නොගතහොත් යාවජීව සාමාජිකත්වය ලැබූ දිනය ලෙස සලකනු ලබන්නේ නැවත සාමාජිකත්වය අලුත් කල දිනයයි.

තාවකාලික සාමාජිකත්වය ලැබූ සාමාජිකයින්ට අදාල කාලය තුලදී යාවජීව සාමාජිකයෙකු සතු සියළු අයිතිවාසිකම් හා වරප්‍රසාද හිමි වේ.

3. **සාමාජික මුදල**

**පවතින වගන්තිය**

6.1. යාවජීව සාමාජික ගාස්තුව රු.4000/- කි.(අවශ්‍යතාවය අනුව සංවත්සරික මහ සභාව මගින් මෙම මුදල සංශෝධනය කළ හැක.)

**එකතු කළ යුතු සංශෝධනය**

6.1.1. උසස් පෙළ විභාගය අවසන් වූ දා සිට වයස අවුරුදු විසි පහ (25) දක්වා තාවකාලික සාමාජික ගාස්තුව රු.1000 කි. වයස අවුරුදු විසි පහට (25) පෙර යාව ජීව සාමාජිකත්වය ලබා ගන්නේ නම් නැවත ගෙවිය යුතු වන්නේ රු. 3000 /- කි. එසේ නොවූව හොත් නැවත සාමාජිකත්වය අළුත් කර යාවජීව සාමාජිකත්වය ලබා ගැනීම සඳහා රු. 4000/- ක් ගෙවිය යුතුය

4. **8.7.1 වගන්තිය සංශෝධනය කිරීම .**

**පවතින වගන්තිය**

8.7.1 ගරු ක්‍රියාකාරී සභාපති, ගරු සම ලේකම් වරු, ගරු භාණ්ඩාගාරික, ගරු ජ්‍යේෂ්ඨ උප සභාපති, ගරු උප සභාපති යන තනතුරු සඳහා පත්වන සාමාජිකයන්ගේ සේවා කාලයෙ උපරිමය නොකඩවා වසර තුනකට පමණක් සීමා කෙරේ. නැවත එම තනතුරක් සඳහා පත්විය හැක්කේ එම තනතුරින් ඉවත් වී අවම වශයෙන් වසරක කාලයක් ඉකුත්ව ගිය පසුව වේ.

**එකතු කළ යුතු සංශෝධනය**

8.7.1 ගරු ක්‍රියාකාරී සභාපති, ගරු සම ලේකම් වරු, ගරු භාණ්ඩාගාරික, ගරු ජ්‍යේෂ්ඨ උප සභාපති, ගරු උප සභාපති යන තනතුරු සඳහා පත්වන සාමාජිකයන්ගේ සේවා කාලයේ උපරිමය නොකඩවා වසර තුනකට පමණක් සීමා කෙරේ. නැවත **එකම** තනතුර සඳහා පත්විය හැක්කේ එම තනතුරින් ඉවත් වී අවම වශයෙන් වසරක කාලයක් ඉකුත්ව ගිය පසුව වේ.
**එකම අනුකාරක සභාවේ උප සභාපති තනතුරට පත් විය හැක්කේද වසරක කාලයක් ඉකුත්ව ගිය පසුව වේ.**

5. **නිල කාලසීමාව**

**පවතින වගන්තිය**

14.1.සංගමයේ නිල කාලය හා මුදල් වර්ෂය ලෙස ගණන් ගනු ලබන්නේ අප්‍රේල් 01 දින සිට ඊලග වර්ෂයේ මාර්තු 31 දක්වා අතර කාල සීමාව වේ.

**එකතු කළ යුතු සංශෝධනය**

14.1.1 සංගමයේ නිල කාලය ලෙස ගණන් ගනු ලබන්නේ ජූලි 01 වන දා සිට ඊලග වසරේ ජූනි 30 දක්වා අතර කාල සීමාව වේ.

14.1.2 .සංගමයේ මුදල් වර්ෂය ලෙස ගණන් ගනු ලබන්නේ අප්‍රේල් 01 දින සිට ඊලග වර්ෂයේ මාර්තු 31 දක්වා අතර කාල සීමාව වේ.

**6. ගරු ජ්‍යේෂ්ඨ උප සභාපති කාර්යයන් සංශෝධනය**

**පවතින වගන්තිය**

10.4.1ගරු ක්‍රියාකාරී සභාපති නොමැති විට සභාපති ධූරයෙහි වැඩ කටයුතු සියල්ල කළ යුතු වේ.

10.4.2 අනු කණ්ඩායම්, අනු බද්ධිත කණ්ඩායම් සහ ශාඛාවන් හි කටයුතු මෙහෙයවිය යුතුය.

**එකතු කළ යුතු සංශෝධනය**

10.4.3 එතෙක් පිහිටුවා නැති වසර වල අනු කණ්ඩායම් පිහිටුවීම.

**7. 11.11 වගන්තිය සංශෝධනය**

**පවතින වගන්තිය**

11.11 සාමාජීය අනුකාරක සභාවට වාර්ෂික රාත්‍රී භෝජන සංග්‍රහය, වාර්ෂික සාදය සහ ආගමික හා සංස්කෘතික කටයුතු සංවිධානය අයත් වේ.

**එකතු කළ යුතු සංශෝධනය**

11.11 සාමාජීය අනුකාරක සභාවට වාර්ෂික රාත්‍රී භෝජන සංග්‍රහය, දේවන්ස් රාත්‍රිය (Devans Night) සංවිධානය ඇතුළුව කෘත්‍යාධිකාරී මණ්ඩල නියම කරන අනිකුත් උත්සවයන් සංවිධානය කිරීම අයත් වේ.

**8. 15.0 මුදල් වගන්තිය සංශෝධනය**

**පවතින වගන්තිය**

15.1 සංගමය සතු සියළුම මුදල් කෘත්‍යාධිකාරී මණ්ඩලයේ තීරණය පරිදි ශ්‍රී ලංකාවේ පිළිගත් ඕනෑම බැංකුවක සුදුසු ගිණුම්වල තැන්පත් කළ යුතුයි.

15.2 කෘත්‍යාධිකාරී මණ්ඩලයේ තීරණය පරිදි වෙනත් ඕනෑම පිළිගත් මුදල් ආයතනයක් සමග සංගමයට ගනුදෙනු කළ හැකිය.

**එකතු කළ යුතු සංශෝධනය**

15.1 සංගමය සතු සියළුම මුදල් කෘත්‍යාධිකාරී මණ්ඩලයේ තීරණය පරිදි **ශ්‍රී ලංකා මහ බැංකුව** පිළිගත් ඕනෑම බැංකුවක සුදුසු ගිණුම්වල තැන්පත් කළ යුතුයි.

15.2 කෘත්‍යාධිකාරී මණ්ඩලයේ තීරණය පරිදි වෙනත් ඕනෑම **ශ්‍රී ලංකා මහ බැංකුව** පිළිගත් මුදල් ආයතනයක් සමග සංගමයට ගනුදෙනු කළ හැකිය.

**2023/07/13 දින පැවති මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ විශේෂ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් යෝජනා ස්ථිර කළ ව්‍යවස්ථා සංශෝධනයන්.**

**9. පවතින වගන්තිය**

08.07.11 පහත සදහන් තනතුරු සදහා නාම යෝජනා පත්‍ර කැදවා නිළධාරීන් තෝරා පත් කරගත යුතුය. 8.3.2, 8.3.3, 8.4.2, 8.4.3, 8.4.4, 8.5.5. ( 8.4.3, සදහන් උප සභාපතිවරුන්ගෙන් සුභසාධක අනුකාරක සභා උප සභාපති සදහා නාම යෝජනා කැදවීම් අවශ්‍ය නොවේ.)

**එකතු කළ යුතු සංශෝධනය**

08.07.11 පහත සදහන් තනතුරු සදහා නාම යෝජනා පත්‍ර කැදවා නිළධාරීන් තෝරා පත් කරගත යුතුය. 8.3.2, 8.3.3, 8.4.2, 8.4.3, 8.4.4, 8.4.5. ( 8.4.3, සදහන් උප සභාපතිවරුන්ගෙන් සුභසාධක අනුකාරක සභා උප සභාපති සදහා නාම යෝජනා කැදවීම් අවශ්‍ය නොවේ.) එක් සාමාජිකයෙකුට ඉල්ලුම් කල හැක්කේ ඉහත එක් තනතුරක් සදහා පමණි.

**10. පවතින වගන්තිය**

21.1.2 නාම යෝජනා පත්‍ර ඉදිරිපත් කිරීමේදී ඉල්ලුම් කරු නිවැරදිව සම්පූර්ණ කර සාමාජිකයින් දෙදෙනෙකු ගෙන් යෝජනා ස්ථිර කරවා ලේඛනගත තැපැලෙන් ගරු සමලේකම්වරුන් වෙත එවිය යුතුය.

**එකතු කළ යුතු සංශෝධනය**

21.1.2 නාම යෝජනා පත්‍ර ඉදිරිපත් කිරීමේදී ඉල්ලුම් කරු නිවැරදිව සම්පූර්ණ කර සාමාජිකයින් දෙදෙනෙකු ගෙන් යෝජනා ස්ථිර කරවා ලේඛනගත තැපැලෙන් හෝ ආදි ශිෂ්‍ය සංගම් කාර්යාලයට පැමිණ හෝ මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ ගරු සමලේකම්වරුන් වෙත එවිය යුතුය.

කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අණ පරිදි,
සමලේකම්වරු